#  ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1993/34 - 2016 නොවැම්බර් මස 18 වැනි සිකුරාදා - 2016.11.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3 (4) වගන්තිය යටතේ වූ නිවේදනය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 (4) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සංවර්ධන ක්‍රමෝපාය සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය මලික් සමරවික්‍රම වන මම, මුදල් විෂය භාර අමාත්‍යවරයාගෙන් ද විමසීමෙන් අනතුරුව මෙම නිවේදනය මගින් :-

(1) ඉහත කී පනතේ අරමුණු සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනා ගෙන ඇති බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ 02, කොම්පඤ්ඤවීදියේ පිහිටි අක්කර අටකින් (08) යුත් ඉඩමක ("එකී ප්‍රදේශය") ඇමෙරිකානු ඩොලර් මිලියන එකසිය තිහක (ඇ.ඩො.මි. 130) සෘජු විදේශ ආයෝජනයක් ඇතුළත් ඇමෙරිකානු ඩොලර් මිලියන හාරසිය විසිනවයයි දශම පහක් (ඇ.ඩො.මි. 429.5) අපේක්ෂිත ආයෝජනයක් සහිත ප්‍රති සංවර්ධනය සහ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් (ව්‍යාපෘතිය), ඉහත කී පනතේ අරමුණු සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හැඳින්වෙන දැන්වීම 2016 ජුනි 30 වැනි දින අංක 1973/58 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද බවත්,

(2) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ 02, කොම්පඤ්ඤවීදියේ පිහිටි අක්කර අටකින් (08) යුත් ඉඩමක (එකී ප්‍රදේශය) ඇමෙරිකානු ඩොලර් මිලියන එකසිය තිහක (ඇ.ඩො.මි. 130) සෘජු විදේශ ආයෝජනයක් ඇතුළත් ඇමෙරිකානු ඩොලර් මිලියන හාරසිය විසිනවයයි දශම පහක් (ඇ.ඩො.මි. 429.5) අපේක්ෂිත ආයෝජනයක් සහිත ප්‍රති සංවර්ධනය හා මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් (ව්‍යාපෘතිය), ඉහත කී පනතේ 3 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලද බවත්,

(3) ඉහත කී ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිය බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ 02 කොම්පඤ්ඤවීදියේ පිහිටා ඇති අක්කර 08 ක ප්‍රමාණයෙන් යුත් ඉඩමක් මත ප්‍රති සංවර්ධනය හා මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස නම් කර හඳුන්වන අතර "වන් කලම්බු ප්‍රොජෙක්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්" යන සමාගම ව්‍යාපෘති සමාගම වන බවත්.

(4) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ ව්‍යාපෘති සමාගම අතර ව්‍යාපෘති ගිවිසුම් අත්සන් කිරීමේ දින සිට අවුරුදු අටක (08) කාලයක් ඇතුළත ව්‍යාපෘති සමාගම විසින් ව්‍යාපෘති මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීම සහ ආරම්භ කිරීම කරනු ලැබිය යුතු ය.

(5) මෙම නියෝගයේ උපලේඛනයේ විශේෂණය කරන ලද නීතිවලින් නිදහස් කිරීම එහි නිශ්චිතව සඳහන් කර තිබෙන්නා වූ සීමාවන්වලට යටත්ව ව්‍යාපෘති ගිවිසුම අත්සන් කළ දින සිට ව්‍යාපෘති සමාගමට අදාළ වනු ඇත.

1A - PG 3245 —367 (2016/11)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## I වැනි උපලේඛනය

(1) **2006 අංක 10 දරන දේශීය ආදායම් පනත**

(i) *ආයතන ආදායම් බද්ද*

ආදායම් බදු පැනවීමට අදළ වන 2006 අංක 10 දරන ආදායම් පනතේ විධිවිධාන මහල් නිවාස විකිණීම හැර ව්‍යාපෘතියේ ලාභය සඳහා වසර දහයක (10) කාලයක් සඳහා අදාළ නොවිය යුතු අතර මහල් නිවාස විකිණීම තුළින් උත්පාදනය වන ආදායම සඳහා අවුරුදු හයක (06) බදු නිදහස් කාලයක් සඳහා පමණක් දේශීය ආදායම් පනතේ විධිවිධාන අදළ නොවේ.

එකී බදු නිදහස් කාලසීමාව ව්‍යාපෘති සමාගම විසින් බදු අය කළ හැකි ආදායම් උපයනු ලබන වර්ෂයේ සිට හෝ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භකර අවුරුදු හයක (06) කාලයකින් පසුව සහ අවස්ථා දෙකෙන් කලින් එළඹෙන අවස්ථාවේ සිට ආරම්භ විය යුතු ය.

බදු විරාම කාලසීමාව අවසන්වීමෙන් පසුව, මහල් නිවාස විකිණීම හැර වෙනත් කටයුතුවලින් උපචිත වන ලාභය මත අවුරුදු (06) කාලයන් සඳහා ආයතන බද්දෙන් සියයට පනහක් (50%) අදළ විය යුතු ය.

සැකදුරු කිරීමේ කාර්ය සඳහා, ඉහත කී බදු නිදහස් කාලය සහ අනුග්‍රාහකත්ව කාලසීමාව අවසන් වීමෙන් පසුව, ව්‍යාපෘති සමාගමේ ලාභ සහ ආදායමට අදාළ ආදායම් බද්ද තත්කාලයේ බලපවත්නා දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව අදාළ කරගනු ලැබිය යුතු ය.

(ii) *ලාභාංශ මත බද්ද*

නිදහන් කරන ලද ලාභයෙන් කොටස් හිමියන් සඳහා බෙදදෙනු ලබන ලාභාංශ අවස්ථාවෝචිත පරිදි එකී අවුරුදු දහයක (10) බදු නිදහස් කාලසීමාව තුළ දී හෝ අවුරුදු හයක (06) කාලය තුළ දී සහ ඉන්පසුව එක් අවුරුද්දක (01) කාලයක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(iii) *රඳවුම් බද්ද*

පහත සඳහන් අවස්ථාවල දී ව්‍යාපෘති සමාගම රඳවුම් බදු ගෙවීමෙන් නිදහස් වන්නේය. එනම් -

(අ) ප්‍රාග්ධන වියදම සඳහා ලබාගන්නා විදේශ ණය මත වූ පොළිය සඳහා සහ උපදේශකවරුන් සඳහා ගෙවනු ලබන තාක්ෂණික ගාස්තු සඳහා ;

(ආ) දළ මෙහෙයුම් ආදායමෙන් සියයට තුනක් (03) නොඉක්මවන සම්පූර්ණ ගාස්තු ප්‍රමාණයක් සඳහා පමණක් වූ කළමනාකරණ ගාස්තු සහ රාජ්‍ය භාග ගෙවීම සඳහා ;

(ඇ) දළ මෙහෙයුම් ආදායමෙන් සියයට එකයි දශම පහක් (1.5%) නොඉක්මවන සම්පූර්ණ ගාස්තු ප්‍රමාණයක් සඳහා පමණක් වූ අලෙවිකරණ ගාස්තු සඳහා ; සහ

(ඈ) දළ මෙහෙයුම් ලාභයෙන් සියයට දහයක් (10%) නොඉක්මවන සම්පූර්ණ ගාස්තු ප්‍රමාණයක් සඳහා පමණක් වූ දිරිදීමනා කළමනාකරණ ගාස්තු සඳහා.

(iv) *ඉපයුම් මත බද්ද*

ඉපයීම් මත ගෙවිය යුතු බදු මුදල් ගෙවීමෙන් ව්‍යාපෘති සමාගමේ විදේශීය කාර්ය මණ්ඩලය නිදහස් වන අතර මෙම බදු ගෙවීමේ නිදහස යම් දෙන ලද අවස්ථාවක දී සේවා නියුක්තිකයින් පහළවක් (15) සඳහා පමණක් යටත්ව අදළ වන්නේ ය. එම ඉහළ සීමාවට යටත්ව, මෙම බදු නිදහස් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ ව්‍යාපෘති සමාගම අතර ව්‍යාපෘති ගිවිසුම් දින සිට අවුරුදු පහක (05) කාලසීමාවක් සඳහා විදේශීය කාර්ය මණ්ඩලය සඳහා අදළ විය යුතුය. එසේ වුව ද, කිසිදු සේවා නියුක්තිකයකුට මෙම අවුරුදු පහක (05) කාලසීමාව ඉක්මවමින් මෙම නිදහස ලබා නොදිය යුතුය. තව ද, හොඳම උත්සාහ පදනමක් මත දේශීය සේවා නියුක්තිකයන් සමග විදේශීය කාර්ය මණ්ඩලය නිතරම යෙදවීමට ව්‍යාපෘති සමාගම වෙත නියම කරනු ලැබිය යුතු ය.

(2) **2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු (වැට් බදු) පනත**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන ව්‍යාපෘතිය ආශ්‍රිත සියලු භාණ්ඩ ආනයන සහ එම ව්‍යාපෘති ආශ්‍රිත භාණ්ඩ සහ සේවාවල දේශීය මිළදී ගැනීම් සියල්ල, එම ව්‍යාපෘති ක්‍රියාත්මක වීමේ අවුරුදු අටක (08) කාලය තුළ දී එකතු කළ අගය මත බදු (වැට් බදු) ගෙවීමෙන් නිදහස් විය යුතුය. ව්‍යාපෘතිය සඳහා එම කොන්ත්‍රාත්කරු වෙත සැපයීම් කරනු ලබන යම් කොන්ත්‍රාත්කරුවකු හෝ උපකොන්ත්‍රාත්කරුවකු වැට් බදු පනත මගින් අවසර දී ඇති පරිදි බදු විලම්බනය සඳහා හිමිකම් ලබයි.

ව්‍යාපෘති සමාගම විසින් වාණිජ කටයුතු ආරම්භ කරනු ලබන අවස්ථාවේ සිට 2002 අංක 14 දරන වැට් බදු පනතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට වැට් බදු ගෙවීම සඳහා යටත්විය යුතු ය.

(3) **2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (PAL) පනත**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අවුරුදු අටක (08) කාලසීමාව තුළ දී ආනයනය කරනු ලබන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ව්‍යාපෘතිය ආශ්‍රිත භාණ්ඩ මත වරාය සහ ගුවන් තොටුපල බද්ද (PAL) ගෙවීමෙන් සහ අයකිරීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස් කරනු ලැබිය යුතු ය. පහත (05) වන අයිතමයේ සඳහන් කොන්දේසියට යටත්ව එකී ව්‍යාපෘති සමාගම භාණ්ඩ ලබාගන්නා සමාගම වන තාක්දුරට ව්‍යාපෘතිය වෙනුවෙන් ව්‍යාපෘති සමාගම විසින් කරනු ලබන සෘජු ආයෝජන මත හෝ ව්‍යාපෘතියේ කාර්ය සඳහා යම් කොන්ත්‍රාත්කරුවකු හෝ උපකොන්ත්‍රාත්කරුවෙකු විසින් කරනු ලබන ආනයන මත එම බදු නිදහස් කිරීම අදළ වන්නේය.

(4) **2005 අංක 5 දරන මුදල් පනත**

ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2005 අංක 05 දරන මුදල් පනත යටතේ පනවනු ලබන ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බදු වලින් ව්‍යාපෘති සමාගම/කොන්ත්‍රාත්කරුවන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(5) **ව්‍යාපෘති ආශ්‍රිත අයිතම ආනයනය කිරීම මත වූ රේගු බදු**
(රේගු ආඥපනත - 235 වන අධිකාරය)

ප්‍රාග්ධන ස්වභාවයේ සියලු ව්‍යාපෘති ආශ්‍රිත අයිතම සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සමාගමේ නමින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන වෙනත් යම් ව්‍යාපෘති ආශ්‍රිත අයිතම සඳහා රේගු බදු නිදහස් කිරීම අදළ වන අතර එසේ ආනයනය කරනු ලබන අයිතම ව්‍යාපෘති සමාගම විසින් සෘජුවම ආනයනය කරනු ලබන හෝ කොන්ත්‍රාත්කරුවන හා උපකොන්ත්‍රාත්කරුවන් හරහා කොන්ත්‍රාත්කරුවන් වෙත ලැබෙන්නා වූ ද ව්‍යාපෘතියේ කාර්ය සඳහා පරම වශයෙන් ආනයනය කරනු ලබන අයිතම විය යුතු අතර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අවුරුදු අටක (08) කාලසීමාව තුළ නිෂේධන ලැයිස්තුවේ සඳහන් අයිතම හැර ව්‍යාපෘති සමාගමේ නමින් ඉහත කී භාණ්ඩ භාරදෙනු ලැබිය යුතු ය. එම අයිතම ශ්‍රී ලංකාවේ සම්පූර්ණයෙන් නිෂ්පාදනය නොකරන්නේ නම් හෝ ප්‍රමාණවත් තත්ත්වයෙන් සහ ප්‍රමාණයෙන් එම අයිතම ශ්‍රී ලංකාවේ නොපවතීනම් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා නියමිත කාලවල දී එම අයිතම ලබාගත නොහැකි නම් එවැනි නිෂේධන ලැයිස්තුවේ අන්තර්ගත අයිතම ද රේගු බදුවලින් නිදහස් වන්නේය.

ඒ අනුව, ව්‍යාපෘති සමාගම එම භාණ්ඩ භාරගන්නා තැනැත්තා ලෙස නම්කර ඇත්නම් පමණක්, ඉහත විධිවිධාන සලස්වා ඇති ආකාරයට ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අවුරුදු අටක (08) කාලසීමාව තුළ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවකු හෝ උපකොන්ත්‍රාත්කරුවකු හරහා ව්‍යාපෘති ආශ්‍රිත භාණ්ඩ ආනයනය කරනු ලැබිය හැකිය. ඒ අනුව, වෙනත් යම් ආනයන සමග එම ආනයනයන් සිදු කර ඇත්නම්, ව්‍යාපෘති සමාගමේ ව්‍යාපෘති ආශ්‍රිත භාණ්ඩ සඳහා පමණක් මෙහි සඳහන් බදු අනුග්‍රාහකත්වයන් ලැබෙන බව සහතික කිරීම සඳහා ව්‍යාපෘති සමාගම විසින් පරම වශයෙන් වගකියනු ලැබිය යුතුය. ඒ අනුව, කිසියම් හේතුවක් නිසා මෙම කොන්දේසිය උල්ලංඝනය කර ඇති අවස්ථාවක දී, තත්කාලයේ බලපවත්නා නීති සහ නියෝග යටතේ අයකරනු ලැබිය යුතු බදු සහ අයකිරීම් ව්‍යාපෘති ආශ්‍රිත භාණ්ඩ සංයුක්ත කරනු නොලබන සියලු භාණ්ඩ සඳහා අදාළ විය යුතු අතර එම බදු මුදල් වහාම ගෙවනු ලැබිය යුතුය. යම් සේවා නියුක්තිකයකුගේ, උපදේශකයකුගේ පෞද්ගලික/පුද්ගලික භාවිතය සඳහා හෝ වෙනත් ව්‍යාපෘති සමාගමක් වෙනුවෙන් ව්‍යාපෘති සමාගම විසින් පුද්ගලික අයිතම ආනයනය කරනු ලබන අවස්ථාවක දී, එම අයිතම ව්‍යාපෘති ආශ්‍රිත භාණ්ඩ ලෙස සලකනු නොලැබිය යුතු ය. 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධනය ව්‍යාපෘති පනත යටතේ ප්‍රදනය කරනු ලබන නිදහස් කිරීම්/අනුග්‍රාහකත්වයන් සම්බන්ධයෙන් වූ විට, ව්‍යාපෘතිය හෝ ව්‍යාපෘති සමාගමට සම්බන්ධිත කිසිදු කුළී නිවසියකු හෝ වෙනත් පාර්ශවයක් සඳහා එම සම්බන්ධතාවය හේතුවෙන් හෝ එහි ප්‍රතිඵලයක් ලෙස කිසිදු නිදහස් කිරීමක් හෝ අනුග්‍රාහකත්වයක් ප්‍රදනය කරනු නොලැබේ.

මලික් සමරවික්‍රම පා.ම.
සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය,

වර්ෂ 2016 ක් වූ නොවැම්බර් මස 15 වැනි දින.
කොළඹ දී ය.

12 - 214

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.